පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| දිනය Date | 2025.10.22 පැය 1200 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1928/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |
|---|---|---|---|---|---|---|---|

**වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් - වැලිගම පොලිස් වසම.**

2025.10.22 වන අද දින උදෑසන කාලයේ වැලිගම පොලිස් වසමේ වැලිගම ප්‍රාදේශීය සභාව තුලට ඇතුළු වූ පුද්ගලයෙකු විසින් පුද්ගලයෙකුට වෙඩි තබා පලා ගොස් ඇති බවට වැලිගම පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත. තුවාලකරු මාතර රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මිය ගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 38 ක් වූ මිදිගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මියගිය අය වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වන අතර වෙඩි තැබීමට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත. සැකකරුවන් පිස්තෝල වර්ගයේ ගිනි අවියකින් මෙම වෙඩි තැබීම සිදු කර ඇති බවට පොලිසිය සැකකරනු ලබයි. සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා වැලිගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**